**යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ (ඉරනමඩු සංරචකය) - 2014**

යාපනය කිලිනොච්චි ජල සම්පාදන සනීපාරක්ෂක ව්‍යාපෘතියේ -ඉරනමඩු සංරචක 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 පෙබරවාරි 08 දින එළඹි අංක 2711-එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ උප ලේඛන 2 හි II (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේදී පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ඉරනමඩුකුලම් වඩා ශක්තිමත් කිරීම හා විශාල කිරිමෙන් එහි ජල රැඳවීම් ධාරිතාවය වැඩි කිරිම සහ වැඩි කරන ලද ජල රැඳවුමෙන් යාපනය අර්ධද්වීපයේ ජල සම්පාදන ව්‍යාපෘතියට මාසිකව අක්කර අඩි 660 ක් නිදහස් කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඉරනමඩු සංරචකයේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 800 කට සමාන එජඩො මිලියන 16.32 ක් වන අතර ඉන් රු. මිලියන 620 ක සමාන එජඩො මිලියන 13.03 ක් හෝ මුළු පිරිවැයෙන් සියයට 79 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය කිරීමට එකඟ වී ඇති අතර ඉතිරි රු. මිලියන 180 කට සමාන එජඩො මිලියන 3.29 ක් හෝ සියයට 21 ක් ශ්‍රී ලංකා රජය විසින්ද මූල්‍යනය කරනු ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 මැයි 06 දින ආරම්භ කළ අතර 2017 පෙබරවාරි 17 වන විට අවසන් කිරිමට නියමිත විය.

**1.3 ව්‍යාපෘති ක්‍රියාකාරකම්**

ගිවිසුමට අනුව, යාපනය සහ කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ -ඉරණමඩු සංරචකයේ ක්‍රියාකාරකම් පහත සාරංශ කර දැක්වේ.

1 කොටස : වාන් මාර්ග, ටෙන්ටර් දොරටු, වාහක පටි, ශක්ති උත්සර්ජන ආකෘති, පාලම්, සොරොව් දොරටු සහ ස්වයංක්‍රීයයන් ඇතුළු ඉරනමඩු හි ප්‍රධාන කාර්යයන් පුනරුත්ථාපනය. ජලයේ සහ ඉඩම් වල පලදායීතාවයෙහි කල්පවත්නා වැඩි දියුණුව ලගා කර ගැනීම.

2 කොටස : වාරිමාර්ග කාණු පද්ධතිය ඉහල දැමීම සඳහා අළුත්වැඩියා කිරිම.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.5 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් වේ.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණුකළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව,

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.6 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්**

2003 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 364 (3) අනුව, එකතු කළ අගය මත බදු ගෙවීම් විස්තර ඒ ඒ කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් වෙන වෙනම ඊලග මාසයේ 15 දින හෝ ඊට පෙර විගණකාධිපතිට පිටපතක් සහිතව ආයතනය විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. අත්හදා බැලීමේ පරීක්ෂණයක් සිදුකර අනාවරණය කරගෙන තිබුණු පරිදි උපදේශකයන් සඳහා එකතු කළ අගය මත බදු ගෙවීම් එකතුව රු.1,176,042 ක් සම්බන්ධ විස්තර නියමිත කාලය තුළ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යනය හා සමාලෝචිත වර්ෂය තුළ දී අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදි අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දින දක්වා සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යනය කිරිමට එකඟ වූ මුදල | | 2014 වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදන | 2014 වර්ෂය තුළ අරමුදල් උපයෝජනය | | 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) |
| ආ.සං.බැ. | 13.03 | 620 | 620 | 0.07 | 9.12 | 0.32 | 42.71 |
| ශ්‍රී.ලං.ර | 3.29 | 180 | 180 | - | - | - | - |
| එකතුව | 16.32 | 800 | 800 | 0.07 | 9.12 | 0.32 | 42.71 |

**3.2 භෞතික ප්‍රගතිය**

**-----------------**

2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාලයේ වසර 3 ½ ක් අවසන් වී තිබුණද ව්‍යාපෘති ගිවිසුමට අනුව, ජලය සහ සහ ඉඩම් ඵලදායීතාවය කල්පවත්නා වැඩිදියුණුව සාක්ෂාත්කර ගැනීම සඳහා වාන් මාර්ග, ටෙන්ටර් දොරටු, වාහක පටි, ශක්ති උත්සර්ජන ආකෘති, පාලම්, සොරොව් දොරටු සහ ස්වයංක්‍රීයයන් ඇතුළු ඉරනමඩු පුනරුත්ථාපනහයහි ප්‍රධාන වැඩ කටයුතු ආරම්භ කර නොතිබුණි. ජල බෙදාහදා ගැනීමේදී පළාතේ ගොවීන්ගේ බලවත් විරෝධය හේතුවෙන් ඉදිකිරීම් වැඩ ආරම්භ කර නොතිබූ බව මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ සඳහන් කරන ලදි. විගණනයේ අදහස අනුව, ව්‍යාපෘතිය ගොවීන් සමග ව්‍යාපෘති ක්‍රියාකාරකම් පිළිබදව ව්‍යාපෘති ආරම්භක අවස්ථාවේදීම සන්නිවේදනය සඳහා පියවර ගෙන තිබුණි නම් පිරිවැය හා ව්‍යාපෘති කාලය ඉතිරිකර ගනිමින් විරෝධතාවය අවම කර ගැනීමට හැකිව තිබුණි.

**3.3 අදාල නොවන වියදම්**

**----------------------**

වාරිමාර්ග දෙපාර්තමේනතුවට අදාල එකතුව රු. 135,977 ක දුරකථන, විදුලි ගාස්තු සහ පාඨමාලා ගාස්තු වෙනුවෙන් සිදු කරන ලද වියදම් ව්‍යාපෘති වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.